# සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව- 2025.07.30 දින  මාසික මහ සභා වාර්තාව

පළමුව ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියලුම සභිකවරුන් පිළිගන්නා ලද අතර අද දින පළමුවෙන් මහ සභාව නියෝජනය කරන පොදුජන එක්සත් පෙරමුණේ ගරු සභිකවරුන් තිදෙනාහට සුභාශිංෂණ පිරිනමමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මී ලඟට වුයේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගැනීමේ අවස්ථාවයි. ඒ අනුව පසුගිය මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ජේ. ශනිකා ප්‍රියදර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි. මෙ සම්බන්ධයෙන් සභාවේ වෙනත් යෝජනා හෝ අදහස් තිබේද යන්න ගරු සභාපතිතුමා විමසන ලදී. විරෝධතා කිසිවක් නොවූ බැවින් මෙය සත්‍ය වාර්තාවක් බව පිළිගන්නා ලදි.

මී ළඟට වුයේ ගරු සභාපතිතුමා විසින් විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමයි.

01. සියඹලාණ්ඩුව නගරය කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ කිරීමට යෝජිත කසල කළමනාකරණ ව්‍යාපෘතිය පිළිබඳව නිවේදනය ඉදිරිපත් කරන ලදී. මෙය ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාවක් බැවින් ඊට අදාළ පැහැදිලි කිරීම සිදු කරන ලෙස එතුමාට අවස්ථාව ලබා දෙන ලදි. ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ කොට්ඨාශයේ සියලුම උප නගරවල කසල කළමනාකරණ වැඩසටහන් අවධිමත් අයුරින් සිදුවන බවත්, ඊට විකල්පයක් ලෙස නියමු ව්‍යාපෘතියක් වශයෙන් සියඹලාණ්ඩුව නගර සිමාව තුල සැලසුම් කළ විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටත් මීට සම්බන්ධ වන සියලු පාර්ශවයන් විසින් නියාමන කටයුතු සිදු කිරීමටත් ඒ අනුව ආදර්ශමත් නගර කලාපයක් ලෙස මෙය පවත්වා ගෙන යාමටත් සැලසුම් කර ඇති බවයි. මේ සම්බන්ධව පසුගිය දිනක පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ සාකච්ඡාව පැවැත්වූ බවත් එහිදී ඉතා සාධනීය යෝජනා අදහස් ඉදිරිපත් වු බවත් පවසන ලදි. මීට සමගාමීව අගෝස්තු මස 22 වන දින ශ්‍රමදානයක් පැවැත්වීමට සැලසුම් කර ඇති බව පවසන ලදී. ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ අතර ගරු  කේ.ආර්. එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

02. වට්ටාරම මාර්ගයේ පවතින අවධානම් තත්වය සැලකිල්ලට ගෙන අවශ්‍ය ස්ථානවල විදි පහන් සවි කරන ලෙසත්, මාර්ග සංඥා පුවරු සවි කිරිම සුදුසු බවත් නිවේදනය කරන ලදි. ඒ අනුව මෙම මාර්ගය පළාත් මාර්ග දෙපාර්තමේන්තුවට අයත් බැවින් හා ජනතාව නිරන්තරව ගමනාගමනය කරන බැවින් ඉහත කටයුතු සිදු කර දෙන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

03. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ අනුමත කර ඇති සියලු කර්මාන්ත 2025.08.31 දින වන විට අවසන් කර බිල්පත් ඉදිරිපත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් දැනුම් දී ඇති බව සභාවට නිවේදනය කරන ලදී.

04. ආයතනයේ උන්නතිය වෙනුවෙන් කාර්ය මණ්ඩල සුභ සාධනය හා කළමනාකරණය පහසු කර ගැනීම සඳහා නිරන්තරව සොයා බලා ඉදිරි කටයුතු කිරීම පිණිස කමිටුවක් පත් කිරිම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේදී යෝජනා වි තිබුණි. ඒ අනුව මෙම කමිටුව සඳහා සාමාජිකයින් ලෙස පහත අය සුදුසු බව ගරු ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා යෝජනා කළ අතර ගරු කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

01. ගරු සභාපති  - ඩබ්.වි.සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා
02. ගරු උප සභාපති - පි.කේ. අසංක ඉදුනිල් මැතිතුමා
03. ගරු මන්ත්‍රී - ආර්. එම්.අබේපාල මැතිතුමා
04. ගරු මන්ත්‍රී - කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා
05. ගරු. මන්ත්‍රිණී - ජේ.ශනිකා ප්‍රියදර්ශනි මැතිතුමිය
06. සභා ලේකම් - ඩී.එම්. අනුර දිසානායක මහතා
07. වැඩ පරිපාලක - ආර්.එම්.සාලින්ද රත්නායක මහතා

05. කොට්ඨාශයේ වන අලි තර්ජන ඇති ප්‍රදේශවලට ප්‍රමුඛතාවයක් දී විදි පහන් සවි කිරීම සිදු කළයුතුව ඇති බවත් ඒ සඳහා තොරතුරු ලබා ගැනීම පිණිස පහත සඳහන් අය පත් කිරීම සුදුසු බවද ගරු කේ.එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදී.

01. ගරු මන්ත්‍රී කේ.එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.ඒ. පුෂ්පජිත් මදුශංක මැතිතුමා
04. ගරු මන්ත්‍රී මධුසංක අමරසිංහ මැතිතුමා
05. ගරු මන්ත්‍රී බී.බී සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා

මෙම යෝජනාව ගරු කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවිණි.

06. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු ග්‍රාමීය මාර්ග බොහෝමයක් කලක සිට ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වීම හේතුවෙන් හා දීර්ඝ කාලයක් වැසි සහිත කාලයක් පැවති බැවින් දැඩි ලෙස අබලන් වී ඇති බවත්, ඒ අනුව එම මාර්ග ප්‍රතිසංස්කරණය කළයුතු බවටත් සභාපතිතුමා නිවේදනය කරන ලදි. මෙහිදී ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කොට්ඨාශයේ සියලුම වසම්වල මාර්ග පරිහරණය කිරිමට නොහැකි තත්වයක පවතින බැවින් සෑම ග්‍රාම නිලධාරි වසමකම ග්‍රාමීය මාර්ග 1 ½ km බැගින් ආයතනය සතු මෝටර් ග්‍රේඩරය යන්ත්‍රය යොදා මූලික අදියර වශයෙන් සකස් කිරීම සුදුසු බවයි. මේ සඳහා ප්‍රතිපාදන සහා අරමුදලින් යෙදිමට නියමිතයි. මාර්ග සකස් කිරීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමා සමඟ පැවති රැස්වීමේදී ද සාකච්ඡා කළ බවත් ඉදිරියේදී මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රු. මිලියන 550 ක් ලැබීමට නියමිත බවද පවසන ලදි. මේ සියලුම මාර්ග අපේ ග්‍රාමීය මාර්ග වන බැවින් කොට්ඨාශ මට්ටමින් තරඟ කිරිමකින් තොරව එක් කොනක සිට පටන් ගැනීම සුදුසු බව පවසන ලදී. ඒ අනුව ලියන්ගොල්ල කොට්ඨාශයෙන් ආරම්භ කර බුද්ධම කලාපය දක්වා සෑම වසමක්ම ආවරණය වන පරිදි මාර්ග ප්‍රතිසංස්කරණය සුදුසු බව යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි. මේ සමගම JCB යන්ත්‍රයද යෙදවිම සුදුසු බවත් පවසන ලදී. මෙම මාර්ග භාවිතා කරන කොට්ඨාශයේ වෙනත් ආයතනවල බර වාහන යන්ත්‍රද යොදා ගැනීම සුදුසු බව පවසන ලදි. ( පැල්වත්ත, ඇතිමලේ, හිගුරාණ සිනි සමාගම්වල යන්ත්‍රවල සහාය ලබා ගැනිමට කටයුතු කරමු. යන්න පවසන ලදී.) මෙහිදී ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රිතුමිය විසින් ඇය ඉදිරිපත් කර තිබූ මාර්ග සම්බන්ධයෙන් විමසීමක් කරන ලදී. එහිදී ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා රීති ප්‍රශ්නයක් මතු කරන ලදී. තවද ගරු ඩබ්.පී. සමන්වර්ණකුලසූරිය මැතිතුමා ද අදහස් ඉදිරිපත් කරන ලදී. ( සභාවේ ඝෝෂාකාරි තත්වයක් මතු විය.)

ගරු උප සභාපතිතුමා මෙහිදී ප්‍රකාශ කලේ මාර්ග නඩත්තු කිරීමේ දී මාර්ග දෙපස පදිංචිකරුවන් සිදු කර ඇති බාධාවන් ඉවත් කළයුතු බවත් දෙපස කාණු, ඉඩම් හිමියන් විසින් ම පවිත්‍ර කළයුතු බවත්ය. ගරු ටී. ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා ප්‍රකාශ කර සිටියේ මෙම කටයුතු සිදු කරන විට පෙර පැවති හොඳ හර පද්ධති ආරක්ෂා කිරීම සුදුසු බවයි. ගරු බී.බී. සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා ප්‍රකාශ කලේ තමතමන්ගේ නිවාසවලට යන මාර්ග කොටස් නිවෙස් හිමියන් විසින්ම ශුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බවයි. ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා ප්‍රකාශ කලේ මෝටර් ග්‍රේඩර් කරන පාරවල් අවටින් ඇති අතුරු මාර්ගවලින් එන ජලය බැස යාමට සභාව මැදිහත් වී බෝක්කු දැමීම සුදුසු බවයි. මෙහිදී ගරු ඩබ්.පී.සමන් වර්ණකුලසූරිය මැතිතුමා ප්‍රකාශ කලේ දොඹගහවෙල උප කාර්යාලයේ කොන්ක්‍රීට් වැඩපල සක්‍රීය කර අවශ්‍යා හියුම් පයිප්ප සකසා ගැනීම සුදුසු බවයි. එලෙසම ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා ප්‍රකාශ කලේ මාර්ගය දෙපස කෙළවර නිසි ලෙස සකස් කර එම බිම් ප්‍රමාණය මාර්ග රක්ෂිතය ලෙස වෙන් කිරීම සුදුසු බවයි. මෙම මැනුම් කටයුතු සිදු කිරිම පසුගිය කාලයේ සිදු කිරීමට උත්සාහ කළත් මිනින්දෝරුවරුන්ගේ පවතින හිඟය නිසා එය කළ නොහැකි වූ බව ගරු.ඩබ්.පී.සමන් වර්ණකුලසූරිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

07. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කාලයක සිට භුක්ති විඳිනු ලබන කන්ද උඩ පංගුව මහජන පුස්තකාලය පිහිටි ඉඩම හා මඩුගම පිහිටි කැම්බල් ක්‍රීඩා පිටිය පිහිටි ඉඩම් ප්‍රාදේශීය සභාවට විධිමත්ව පවරාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට සභාවේ එකඟතාවය ලබා ගත යුතු බව නිවේදනය කරන ලදි. ඒ අනුව මෙම ඉඩම් මැන වෙන්කර සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව වෙත විධිමත්ව පවරා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දීම සුදුසු බව නිවේදනය කරන ලදි. මෙම යෝජනාව ගරු සභාපතිතුමා විසින් සිදු කළ අතර ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි.

08. ආයතනයේ විදුලි කාර්මික සේසිරි දසුන් මයා විසින් ආරක්ෂිත විදුලි උපකරණ ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම සභාවට නිවේදනය කරන ලදි. ඒ අනුව මෙම ආරක්ෂිත උපකරණ ලබාදීම අත්‍යාවශයෙන්ම කළයුතු බවත්, ඒවා ලබාදීම අපගේ වගකීමක් බව අදහස් දක්වමින් එම යෝජනාව ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා ස්ථිර කරන ලදි. මෙම ආරක්ෂිත විදුලි උපකරණ පෙර පැවති සභාවල දිද ලබා දීමට තමා විසින් කටයුතු කළ බව ගරු ඩබ්.පී.සමන් වර්ණකුලසූරිය මැතිතුමා විසින් පවසන ලදි.

09. මඩුගම වසමේ ඇති සූරියතලාව මාර්ගය හා බෙහෙත්ගස් ආර හා සියඹලාගස් ආර බෝක්කුවල පැති බැම්ම සකස් කර ජනතාවට යාමට ඒමට හැකිවන පරිදි සකස් කර දීම සුදුසු බවට ගරු උප සභාපතිවරයා විසින් කරන ලද යෝජනාව ගරු කේ.එම්.ධර්මදාස බංඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොකරන ලදි.

මෙහිදි විනාඩි 15කට සභාව කල්තැබිමේ යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සිදු කරන ලද අතර එම යෝජනාව ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

නැවත සභාව ආරම්භ කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සිදු කළ අතර ගරු කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු උප සභාපතිතුමා විසින් මෙහිදී ප්‍රකාශ කලේ රටේ පවතින තත්වය හා ආයතනයේ පවතින ආර්ථික තත්වය මත ඉහත දක්වා ඇති බෝක්කු අලුතින්ම සැකසිය නොහැකි බවත්, අත්‍යාවශ්‍ය සුළු අලුත්වැඩියාවක් සිදු කර ජනතාවගේ ගමනාගමනය සඳහා සකස් කර දීම සුදුසු බවයි. මෙම මාර්ග හරහා පවුල් 1000 ක් පමණ ගමන් ගන්නා බැවින් දැනට සකස් කර ඇති ඇස්තමේන්තු ප්‍රකාරව රු 303647.75 මුදලක් වැය වන බව දක්වා ඇත. ඉදිරි කටයුතු කිරීම සඳහා සභාවේ එකඟතාවය ලබා දෙන ලදි.

10. ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සියලුම සභිකවරුන් මහජන නියෝජිතයින් බවත්, අප කවුරුත් මහජන සේවාවක් සිදු කිරීමට බැඳී සිටින අය බැවින් සියලුම මන්ත්‍රීවරුන් හා වරියන් සඳහා නිල හැඳුනුම්පත් සකස් කිරීම අවශ්‍යතාවය මත මුද්‍රා සකස් කර ගැනීම අත්‍යාවශ්‍ය බව ගරු උප සභාපතිතුමා පවසන ලදී. ඒ අනුව මේ සඳහා දැරිය යුතු වියදම් සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු බී.බී. සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ සාමූහික එකඟතාවය මේ සඳහා හිමිවිය.

11. ප්‍රාදේශිය සභාවට අයත් දොඹගහවෙල සතිපොලහි ඇති වැසිකිළි පද්ධතිය මාස ගණනාවක සිට නිසි ලෙස භාවිතා කිරීමට නොහැකිව පවතින බවත් එයට හේතුව නම් වැසිකිළිවල ඉදිකිරීමේදී සිදු වී ඇති තාක්ෂණික දෝෂයක් බවත් ගරු සභාපතිතුමා පවසන ලදි. එබැවින් ඒ සඳහා කඩිනම් විකල්ප විසඳුමක් යෙදිය යුතුව ඇත. ගලි බවුසරයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බවත් එය ස්ථිර විසඳුමක් නොවන බවත් පවසන ලදි. මේ පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් ද සිදු කළ අතර එහිදී වඩාත්ම සුදුසුම විසඳුම වුයේ ඒ ආසන්නයේ ඇති පැරණි වැසිකිළි වලට බට යොදා එම වලද භාවිතයට ගැනිම සුදුසු බවයි. මේ සඳහා රු133,370.00ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කිරීමට එකඟතාවය විමසා සිටින ලදි. මෙහිදී ගරු ඩබ්.පී. සමන් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වූයේ මෙය උල්දිය සහිත කලාපයක් බවත්, මෙම තත්වය සඳහා විකල්ප විසඳුමක් ලබාදිය

යුතු බවත්ය. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් කරන යෝජනාව ස්ථිර කරන බවත්, අදාළ ඇස්තමේන්තුව පරිදී එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරිම සඳහා සභාවේ පූර්ණ එකඟතාවය ලබා දෙන බවත් පවසන ලදි.

මී ළඟට  සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ කළින් සිදු කළයුතු දෙයක් නිවැරදි කිරිමක් ලෙස නොපැමිණි මන්ත්‍රීවරුන් පිළිබඳව දැනුවත් කිරිම සිදු කරන බවයි. ඒ අනුව ගරු එම්.ඒ. චාන්දන බණ්ඩාර මැතිතුමා, ගරු ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංක අමරසිංහ මැතිතුමා, එල්.එච්. හර්ෂණි මධුමාලී මැතිතුමිය නොපැමිණෙන බව, ගරු සභාපතිතුමා විසින් සභාවට නිවේදනය කරන ලදි.

<u>සභාව අමතා එවන ලද ලිපි, පෙත්සම් ඉදිරිපත් කිරීම</u>

01. රිටිගහවත්ත ගම්වාසින් විසින් යොමු කර තිබූ තිබ්බටුවාව තනිකොටුවයාය මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස කරන ලද ඉල්ලීම සභාවට ඉදිරිපත් කරන ලදි. සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් ඇති අවස්ථාවක නියමිත ක්‍රමවේද අනුගමනය කරමින් මෙම මාර්ගය සකස් කරදිම සුදුසු බවට සභා අනුමැතිය ලබා දෙන ලදි.

02. බුද්ධම වරාගම ප්‍රාථමික විදුහලේ ක්‍රීඩා පිටිය සකස් කර දෙන ලෙස වරාගම පාසලේ විදුහල්පති ඒ.අජිත් කුමාර මහතා විසින් කර තිබු ඉල්ලීම සභාවට ඉදිරිපත් කරන ලදි. මේ සම්බන්ධව ගරු ජී.එම්. සුනිල් ප්‍රේමරත්න මැතිතුමා ද අදහස් ඉදිරිපත් කරන ලදී. මේ සඳහා ද විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් ක්‍රිඩා පිටිය සකස් කර දීම සුදුසු බවට සභා අනුමැතිය ලබා දෙන ලදි.

03. දොඹගහවෙල නුගගහකිවුල තලාකොළයාය අතුරු මාර්ගය සකස් කර දෙන ලෙස කේ. එම්. සමන් කුමාර මහතා විසින් කර තිබු ඉල්ලිම සභාවට ඉදිරිපත් කරන ලදි. මෙය කොන්ක්‍රිට් කර ස්ථිරව සකස් කළයුතු කොටසක් බව ගරු කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මැතිතුමා අදහස් ප්‍රකාශ කල අතර සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් ඇති අවස්ථාවක මේ සඳහා මැදිහත්ව කටයුතු කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදි.

04. දොඹගහවෙල නගර මධ්‍යයේ පිහිටි පැරණි මිණි කෝප් සිටි ගොඩනැගිල්ල සමුපකාර සමිතියට පවරා දෙන ලෙස. විවිධ සේවා සමුපකාර සමිතිය,ඇතිමලේ සාමාන්‍යාධිකාරි විසින් ඉල්ලිමක් කර තිබුණි. එය සභාවට ඉදිරිපත් කර අදහස් විමසන ලදි. මෙහිදි අදහස් දැක්වූ ගරු ඩබ්.පි. සමන් වර්ණකුලසුරිය මැතිතුමා පවසා සිටියේ දැනට වසර විස්සක පමණ කාලයක සිට මෙය භාවිතා කර දැනට වසා දමා ඇති බවත්, ඇතිමලේ පොලිසිය පිහිටි ස්ථානය මේ ආකාරයෙන් ලබාගෙන පොලිසියට පසුව පවරා ගත් බවත්, මෙම ගොඩනැගිල්ලටද එම තත්වයම ඇති විමට ඉඩ ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ලබාදිම නොසුදුසු බවත් එය අපේ වත්කමක් ලෙස තවදුරටත් වැඩිදියුණු කර ටෙන්ඩර් මඟින් බදු දී විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කිරිම සුදුසු බවත් පවසන ලදි. එලෙසම සමුපකාරය සතු කොප් සිටිය දැනට ඔවුන් පරිහරණය නොකර පිටස්තර පාර්ශවයන්ට ලබා දි තිබෙනවා. ඒ නිසා මේ ගැන නැවත සලකා බලා කටයුතු කිරිමට මා යෝජනා කර සිටින බවට පවසන ලදි. ගරු උපසභාපතිතුමා පවසා සිටියේ මෙය අපේ වත්කමක් බැවින් එය අප භාරයේ තබා ගනිමින් සංවර්ධන කිරිම සුදුසු බවත්, මෙම ඉල්ලිම අප ප්‍රතික්ෂේප කරනවා. ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළේ මෙම ගොඩනැගිල්ල අපි සංවර්ධනය කර කොට්ඨාශයේ ව්‍යවසායකයින්ට වෙන් වෙන්ව අවස්ථාව ලබා දිම සුදුසු බවයි. ගරු ආර්. එම්. වසන්ත රංජිත් කුමාර  මැතිතුමා ප්‍රකාශ කර සිටියේ දැනටමත් සමුපකාරයේ කඩ කාමර වහලා තිබෙනවා. හැකියාවක් ඇත්නම් අප ලබා ගැනිමට කටයුතු කිරිම සුදුසු බවයි.

05. ඇතිමලේ තිස්සපුර අංක 234 ඉඩම තුල 1992 ඉදි කල පවත්වාගෙන යන පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් මෙයින් පවුල් 32ක් පමණ ජලය ලබා ගන්නා බවත් එය විධිමත් කිරිම සඳහා ප්‍රාදේශිය සභාව මඟින් අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙස කේ. එම්. එස්. පී. කුමාර මහතා  කර තිබු ඉල්ලිමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි. ඊළඟ මහ සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි. මෙහිදි ගරු බී. බි. සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා ප්‍රකාශ කලේ දැනට මෙම

ළිඳට වතුර මෝටර් 06 ක් සවිකර ඇති බවත් මෙය ප්‍රතිසංස්කරණය කිරිමේදි ඇතිමලේ පොළ භූමියේ රැස් කර ඇති කළු ගල් යොදා ගතහැකි බවයි.

06. බිදුණු කණ්ඩිය වැව ඇතිමලේ රක්ෂිතය වෙන් කර දෙන ලෙසත් වැව් කණ්ඩිය කපා වගා කිරිම නතර කර දෙන ලෙස බිදුණු කණ්ඩිය එක්සත් තිස්ස ගොවි සංවිධානය විසින් කර තිබූ ඉල්ලිම සභා ගත කරන ලදි. මෙම ඉල්ලිම සම්බන්ධයෙන් සභාවට මැදිහත්ව කටයුතු කිරිම අපහසු බැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිමට උපදෙස් ලබාදෙන ලදි.

07. මි ළඟට ගරු කේ.එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව
මහකළුගොල්ල පල්ලේගම, කරඹගොඩ යන ප්‍රදේශවලට පසුගිය මාස 08ක වර්ෂාපතනය හේතුවෙන් එම ප්‍රදේශවල පාරවල් අබලන්ව පවතින බවත්, ජල ප්‍රශ්නය යම් පිරිසකට උග්‍රව බලපා ඇති බවත්, ඒ අනුව මේ වන විට විසඳුම් සෙවිම සඳහා අවශ්‍ය සැලැස්මක් සභාවට ඉදිරිපත් කරන බවත් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලිම, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩ සටහනකට හෝ ග්‍රාමිය මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ සටහනකට යොමු කිරිම සුදුසු බවට තීරණය කරන ලදි. මෙහිදි ගරු කේ.එම්. ගුණරත්න මැතිතුමා ප්‍රකාශ කර සිටියේ විදුලි බිල් නොගෙවිම හේතු වෙන් පවුල් 80 කට ජලය කපා හැර ඇති බවත් භාවිතයට ගතහැකි නළ ළිං 03 ක් පවතින බැවින් ජලය බෙදිම අත්‍යවශ්‍ය නොවන බවත්ය. මෙහිදි ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ ජල ගැටළු සම්බන්ධයෙන් පාර්ශවකරුවන් කැඳවා පැවති රැස්විමේදි මේ පිළිබඳ සාකච්ඡා කල බවත් පවුල් 200 ක් සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා දි ඇති බවත් ඒ අනුව ඉතිරි 80 දෙනාට මෙලෙස ලබාදෙන ජලය නොලැබිම හේතුවෙන් සමස්ථ විදුලි බිලම ඔවුන්ට ගෙවිමට සිදුවිමත්ය. එහෙත් එම විදුලි බිල ගෙවිම මෙම ආයතනයට අසීරු බවත් හේතුවෙන් මෙම තත්වය ඇති වී තිබෙන බවයි. නළ ජලය ලබා දෙන පිරිසට ජලය නොලැබුණු හොත් ජල සම්පාදන මණ්ඩලය ඒ සඳහා මැදිහත් වන බව පවසන ලදි. තවද කිසිදු අංශයකින් ජලය ලබාදිම ආවරණය නොවන පිරිසට පානිය ජලය අවශ්‍ය වන්නේ නම් වසමේ ග්‍රාම නිලධාරි මඟින් එම ඉල්ලිම ප්‍රාදේශිය අපදා කළමනාකරණ ඒකකයට යොමු කරන ලෙස ඒ අනුව එක් අයෙකුට ලිටර් 5 බැගින් වන සේ දෛනිකව ජලය ලබා දිමට වැඩ පිළිවෙලක් සකසා ඇති බවත් පැවසු බවයි.
මේ සම්බන්ධව ගරු කේ. එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මේ සම්බන්ධව ප්‍රාදේශිය සභාව සාධනීය මැදිහත්විමක් ලබා දෙමින් ජලය බෙදාහැරිමට බවුසරයක් ලබා දීමට ඉදිරිපත් වුවත් එය රැගෙන යාමට ට්‍රැක්ටරයේ රියදුරකු නොමැති බව ප්‍රකාශ කළ බවයි. ගරු සභාපතිතුමා පැවසුවේ “ඒ බව මා වෙතද දැනුවත් කළ බවත් සාකච්ඡා කර යම් තිරණයකට එළඹෙමු ”යනුවෙනි.

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත
යථා පරිදි කල් දී ඇති යෝජනා

<u>ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා</u>
ලියන්ගොල්ල, මඩුකොටන්පුදාම ක්‍රිඩා පිටිය හා සුසාන භූමිය පවතින ඉඩම භාවිතා කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් ලිපියකින් පමණක් අවසර දි ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු කිරිමේදි යම් යම් ගැටළු තත්වයන් මතුවන බැවින් එම ඉඩම විධිමත්ව පවරා ගැනිමට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. කහඇල්ල ශ්‍රීපහන නාන පිහිල්ල අසලින් වැසිකිළි පද්ධතියක්, මොනරාගල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ප්‍රතිපාදන යටතේ සකස් කර ඇති බවත්, එය දැනට භාවිතයට ගත නොහැකි තත්වයක ඇති බවත්, ඒ අනුව ගස් වැවී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. මෙය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් භූමියක් බැවින් විධිමත්ව පවරා ගැනිමට හැකි වුවහොත් ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරිමට හැකි බව පවසන ලදි. මෙම තත්වය ප්‍රාදේශිය සභා සම්බන්ධිකරණ කමිටුවට යොමු කිරිම සුදුසු බවද පවසන ලදි. තවද අඹලන්ද සුසාන භූමිය කොටසක් පුද්ගලයෝ අල්ලා ගෙන ඉන්නවා. මෙය ප්‍රාදේශිය සභාවට පවරා දෙන ලෙස දන්වා යැවිම සුදුසු බවත් එහි ක්‍රිඩා කිරිම නතර වී ඇති බැවින්

ඒ සඳහා මැදිහත් වු ළමුන් මත් ද්‍රව්‍ය භාවිතය වැනි විවිධ ඇබ්බැහිවිම්වලට යොමු වී ඇති බවට දැන ගන්නට තිබෙනවා. මෙහිදි ගරු ආර්. එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රීතුමිය පැවසුවේ අක්කර දෙකක භූමියද අනවසරෙන් අල්ලා ගෙන ඉන්නවා. කඩිනම් ශ්‍රමදානයක් යොදාගෙන මෙය එළිපෙහෙළි කරමු. වැහි කාලයට පවතින අසීරුතාවයට මුහුණ දිම සඳහා සොහොන් ගෙයක් සකස් කිරිමට පියවර ගැනිම සුදුසු බව පවසන ලදි. එලෙසම ගරු ආර්. එම්. වසන්ත රංජිත් කුමාර මැතිතුමා ප්‍රකාශ කලේ වසම් 48 හිම පවතින සුසාන භූමි විධිමත්ව පවරා ගැනිමට කටයුතු කිරිම සුදුසු බවත් ප්‍රාදේශිය සභාව මැදිහත් වී මැනුම් නියෝග ලබාගෙන ඉදිරි කටයුතු කිරිම සුදුසු බව පවසන ලදි.

<u>ගරු ආර්. එම්. අජිත් කුමාර මැතිතුමා</u>

අවුරුදු 50ක් පමණ පැරණි මොරගහගොඩ වැවේ සොරොව්ව කැඩී යාමේ අවධානමක් ඇති බවත් එසේ වුවහොත් විශාල ගැටළුවකට මුහුණදිමට සිදුවන බවත් ඒ සඳහා මහ වැස්ස ආරම්භ විමට පෙර එය සකස් කර ගැනිමට අදාල පාර්ශව දැනුවත් කරන ලෙසත් දැනුම් දෙන ලදි. ගුරු හෙළ වසමට අයත් පොදු ක්‍රිඩාංගනය සකස් කර ජනතා පරිහරණය සඳහා ලබා දිම සුදුසු බවට දැනුම් දෙන ලදි. එලෙසම ටොම් ජේ.සී අඹ වගාවට ඉඩමක් වෙන් කර දිය හැකි නම් එය ඵලදායි වේ ප්‍රකාශ කරන ලදී.

කොඩයාන සිට ඇතිමලේ 5 කණුව දක්වා වු කලාපය තුල ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානයක් නොමැති විම හේතුවෙන් ජනතාව දුෂ්කරතාවයට පත්ව සිටිනවා. මේ සඳහා බහු කාර්ය ගොඩනැගිල්ලක් සකස් කිරිම සුදුසු බව යෝජනා කරනවා. තවද කඩ කාමර සමඟ තැපැල් කාර්යාලයක්ද වැසිකිළි පහසුකම් ද සකස් කර දිමට හැකි නම් එය විශාල ප්‍රයෝජනයත් වන බවට සඳහන් කරන ලදි. කලින් කුඩා වැසිකිළියක් තිබුණත් එය මාර්ග සංවර්ධන ආධිකාරියෙන් කඩා ඉවත් කිරිම තුල ජනතාව ප්‍රායෝගිකව විශාල ගැටළුවකට මුහුණ දෙන බව පවසන ලදි. එලෙසම ග්‍රාම නිලධාරි වසම් 48 ආවරණය වන පරිදි එක් වසමකින් ගොවින් 10 දෙනා බාහිරින් හඳුනාගෙන "ග්‍රීන් හවුස් ව්‍යාපෘතියක් යෝජනා කරන ලදි. මෙහිදි ගරු උප සභාපතිතුමා සඳහන් කළේ බහු කාර්ය ගොඩනැගිල්ල පිළිබඳ ඉල්ලිම නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙසයි. අපි අදාල වාර්තාවක් කොට්ඨාශය සඳහාම හදන්න උත්සාහ ගන්නවා. අප සතුව දත්ත හා නිවැරදි තොරතුරු තිබේ නම් ජාතික අයවැයට හා ආයතනයේ අයවැය සකස් කිරිමට ඒවා අදාළ කර ගත හැකි බව සඳහන් කළ හැකිය. එලෙසම කොට්ඨාශයේ මාතෘ සායන ග්‍රාම නිලධාරි කාර්යාලය, තැපැල් කාර්යාලය, ආයුර්වෙදය ආදි තොරතුරු ලබා ගැනිම සම්බන්ධව සභා අනුමැතිය හිමිවිය. මෙහිදි ගරු ආර්.එම්. වසන්ත රංජිත් කුමාර මැතිතුමා සඳහන් කළේ මෙම ඉල්ලිම මිට පෙර මා විසින් ඉල්ලු බවත් අදාල ඉඩම් කොටස ප්‍රාදේශිය සභාව මැදිහත් වී මැනුම් කටයුතු කිරිමට හැකියාවක් නැතිනම් තමා පුද්ගලිකව මැදිහත් වී මැනුම් කිරිමට කටයුතු කරන බවයි.

<u>කාරක සභා වාර්තා සලකා බැලීම</u>

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව 2025.07.14 හා 2025.07.17 දින පැවති කමිටුවේදි යෝජනා කළ සියලුම කරුණු සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදි. ඒ පිළිබඳ විස්තරයක් ගරු සභාපතිතුමා සහ කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. ආයතනයේ අත්‍යවශය වාහන නඩත්තු කිරිම හා අළුත් වැඩියා කිරිම සම්බන්ධයෙන් අපගේ විරුද්ධත්වයක් නොමැති බවත් එම කටයුතු නියමිත ක්‍රම අනුගමනය කරමින් සිදු කිරිම පිළිබඳ සියලු දෙනාගේ එකඟතාවය ලබා දෙන බවත් ගරු ඩබ්.පි. සමන් වර්ණකුලසුරිය මැතිතුමා ප්‍රකාශ කරන ලදි. වසර 10 කට වඩා පැරණි වාහන තුන්වන පාර්ශවය යටතේ රක්ෂණය කරන ලෙස ලබාදි ඇති උපදෙස් අනුගමනය කිරිමේදි තවදුරටත් ඒ පිළිබඳ කරුණු තහවුරු කර ගන්නා ලෙස අදහස් දක්වන ලදි.

01. ආයතනයේ සිටින කණිෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් දෛනික කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා දින වැටුප් ගෙවිමේ පදනම මත කෙටි කලක් සඳහා (මාස 06) කම්කරුවන් දෙදෙනකු බඳවා ගැනිමට අනුමැතිය ඉල්ලිම සුදුසු බවට ගරු

උපසභාපතිවරයා විසින් කරන ලද ඉල්ලීම ගරු සමන් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. එම ඉල්ලීම සඳහා සභාවේ ඒකමතිකව සම්මත විය.

සභාව සතු පැරණි පුස්තකාල ගොඩනැගිල්ල සභාව සතු දේපලක් බැවින් එම ගොඩනැගිල්ලේ සිටින ටී.ඒ ප්‍රැන්සිස් මහතා එම ගොඩනැගිල්ලෙන් ඉවත්වන ලෙස දන්වා ලිපියක් යවා ඇත. මේ පිළිබඳ ගරු ඩබ්.පී සමන් වර්ණකුලසූරිය මන්ත්‍රීතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ අප විසින් බදු දෙන ලද දේපල සභා පනතේ බලය භාවිතා කර එම පනතේ ඇති ක්‍රමවේදය අනුගමනය කර පවරා නොගන්නේ මන්ද යන්න පවසන ලදි. ගරු උපසභාපතිතුමා මේ පිළිබඳ පැහැදිලි කරමින් ප්‍රකාශ කර සිටියේ ප්‍රාදේශිය ලේකම්තුමාගේ දැනුවත් කිරිම අනුව සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව පුස්තකාලයක් පමණක් පවත්වාගෙන යාමට අවස්ථා සලසා දී ඇති බැවින් එම කාර්යයෙන් පාරිභාහිර කටයුත්තකට මෙම ගොඩනැගිල්ල භාවිතා කිරිම කර ඇති බවයි. සභාපතිතුමා විසින් ප්‍රකාශ කළේ කවර තරා තිරමක පුද්ගලයකු වුවද අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට අප පසුබට නොවන බවත් එම ගොඩනැගිල්ල සභාව වෙත පවරා ගැනිමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කරන ලදි.

<u>ප්‍රජා සංවර්ධන කාරක සභාව වාර්තා</u>

ගරු සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා හා ගනු ලැබු තින්දු තිරණ මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මේ පිළිබඳව ගරු උපසභාපතිතුමා විසින් පැහැදිලි කිරිමක් සිදු කරන ලදි. විහාරස්ථානවල සැණකෙලි සහ ඉරිදා දින උප කාරක පංති පැවැත්වීම පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලදී. මෙහිදි ඔහු තවදුරටත් කියා සිටියේ විවිධ පිරිස් මහජනතාවගේ සංවේදීතාව උපයෝගි කරගෙන පුද්ගලික න්‍යාය පත්‍රයකට මුවා වී විශාල මුදලක් ඉපයිමට කටයුතු කරන බවයි. ලැබෙන ආදායම පිළිබඳ කිසිම වාර්තාවක් නැ, වගකියන කෙනෙක් නැ, මෙම වැඩසටහන කරන විහාරස්ථානවල විහාරාධිපති හිමිවරුන් මෙම තත්වය පැහැදිලිව දන්නෙත් නැ. මෙම තත්වය මත අන්‍යාගමික කරණයට ලක් වෙමින් පවතින වටපිටාවන් නිර්මාණය වෙනවා පන්සල් පුජා භුමියක් මිසක් සැණකෙළි භුමියක් නොවිය යුතුය. මෙම තත්වය ඔඩු දුවන්න දිය යුතු නැහැ. මෙම තත්වය ඉතා සැලකිල්ලෙන් යුතුව විසඳා ගැනිමට කටයුතු කළ යුතුය. අනාගත පාරම්පරාව වෙනුවෙන් අපි සියලු දෙනා එකාවන්ව මෙම අවිධිමත් තත්වය පාලනය කිරිමට මැදිහත් වියයුතු බව සඳහන් කරනවා. ශාසනාරක්ෂක බල මණ්ඩල ගරුතර ස්වාමීන් වහන්සේලා, ප්‍රාදේශීය ලේකම්තුමා සම්බන්ධ කරගෙන විධිමත් සාකච්ඡාවක් සිදු කිරීමට අනුමැතිය ලබා දෙන්න. එම යෝජනා ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටින ලද අතර ඒ සඳහා ඒකමතිකව එකඟතාවය ලබා දෙන ලදි. ඒ අනුව කිසිම පාර්ශවයන්ට අගතියක් හානියක් හෝ විශේෂ වාසියක් ඇති නොවන පරිදි ඉතාමත් කල්පනාවෙන් මෙවැනි ගැටළු විසඳිමට මැදිහත් විම සුදුසු බව ගරු කේ. ආර්. එම්. අමරවංශ මන්ත්‍රීතුමාද, ගරු ඩී.එම්.මධුරාණි දිසානායක මන්ත්‍රීතුමියද, ගරු ඩබ්.පී. සමන් වර්ණකුලසූරිය මන්ත්‍රීතුමාද අදහස් ප්‍රකාශ කරන ලදි.

<u>ආදායම් වියදම් වාර්තා සම්මත කිරිම</u>.

2025.06.13 දින සිට 2025.06.30 දින දක්වා ආදායම් වියදම් වාර්තා සත්‍ය වාර්තාවක් ලෙසින් පිළිගැනිම සුදුසු අතර එම යෝජනාව ගරු කේ.ආර්.එම්. අමරවංශ මන්ත්‍රීත්‍රමා ඉදිරිපත් කළ අතර ගරු ආර්. එම්. ඉන්ද්‍රාවති මන්ත්‍රීතුමිය ස්ථිර කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවිය.

මීළඟට මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්විමේ අවස්ථාව බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදි.

**<u>ගරු කේ.එම්. වසන්ත රංජිත් කුමාර මන්ත්‍රීතුමා</u>**

මොහු විසින් සභාවෙන් විමසා සිටියේ ගැමිදිරිය ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද මෙම ගොඩනැගිලි හා වත්කම් ඇතුළු දේපල රාශියක් ඇති බවත්, ඒවා පිළිබඳ කිසිදු නියාමනයක් හා සොයා බැලීමක් දැනට සිදු නොවන අතර ඒ පිළිබඳ ව සොයා බැලිය යුතු බවත්, මෙම තත්වය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීම සුදුසු බවත් පවසන ලදි ,

කොට්ඨාශය පුරා විවිධ ස්ථාන වල අවිධිමත් අයුරින් විදුරු, බෝතල් ආදි නොදිරන අපද්‍රව්‍ය පරිසරයේ තිබීම හේතුවෙන් විවිධ රෝගාබාධ වසංගත ව්‍යාප්ත වීමේ අවධානමක් පවතින බැවින් ඒවා ඉවත් කිරිමේ වැඩපිළිවෙලක් සකස් කරන මෙන් ඉල්ලා සිටින ලදි. මෙහිදි ගරු සභාපතිතුමා පැවසුවේ වසම් මට්ටමින් දැනටමත් මෙලෙස ඉවත් කර ඇති නොදිරන අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් එකතු කර භාර දෙන ලෙස දැන්වා ඇති බවත්, එසේ ලබා දෙන ද්‍රව්‍ය ඕනෑම අවස්ථාවක අප ආයතනය මැදිහත් වී රැගෙන විත් සුදුසු විකල්ප ක්‍රියා මාර්ගයන් ගත හැකි බව ගැමිදිරිය ව්‍යාපාරය සම්බන්ධව විගණනයක් සිදු කිරිම සඳහා අදාළ පාර්ශව දැනුවත් කිරිමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

**<u>ගරු ජේ.ශනිකා ප්‍රියදර්ශන මන්ත්‍රීතුමිය</u>**

මෙහිදි මෙම මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කර සිටියේ යක්කඳුරාව ග්‍රාම නිලධාරි වසමට වෙන්කර ඇති STF කඳවුර අසල ඇති පොදු සුසාන භූමිය විධිමත් පරිදි ප්‍රාදේශිය සභාව වෙත පවරා දී ඇති බැවින් එය හඳුනා ගැනිම සඳහා යක්කඳුරාව පොදු සුසාන භූමිය ලෙස දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරිමට කටයුතු කර දෙන ලෙසයි. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිවරයා දැනුම් දෙන ලදි.

**<u>ගරු කේ.එම් අජිත් පුෂ්ප නන්ද මන්ත්‍රීතුමා</u>**

කොට්ඨාශයේ අඩු ආදායම්ලාභින් සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබා දිමේ සුදුස්සන් තෝරා ගැනිමේදි විශාල අසාධාරණයක් සිදු වී ඇති බවත් සත්‍ය ලෙසම ප්‍රතිලාභ ලැබිය යුතු අය මඟ හැරි ඇති බවත් ලබා නොදිය යුතු කණ්ඩායමක් ඊට ඇතුළත් වී ඇති බවත් පවසන ලදි. මෙහිදි ගරු සභාපතිතුමා ප්‍රකාශ කලේ දැනට මෙම වැඩ සටහනේ අවසන් අදියරේ පවතින බවත් මෙම ගැටළුව ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් විරෝධතා පවතින්නේ නම් එම විරෝධතා ඉදිරිපත් කිරිමට අවස්ථාව ඇති බවත්ය. මෙහිදි ගරු ආර්.එම්.ඉන්ද්‍රාවතී මන්ත්‍රීතුමිය සඳහන් කලේ ගරු කේ.එම්.අජිත්පුෂ්ප නන්ද මන්ත්‍රීතුමා පවසන කතාව නිවැරදි බවත්, පෙරට වඩා දැන් එම කටයුතු හොඳින් සිදුවන බවත් කිහිප දෙනෙකුට අසාධාරණයක් සිදු වී ඇති බවත් දැනුම් දෙන ලදි. ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරමින් ගරු කේ.එම්. වසන්ත රංජිත් කුමාර මැතිතුමා සඳහන් කලේ එක් එක් වසම් වල අස්වැසුම ප්‍රතිලාභ ලබා දිමට හඳුනාගෙන ඇති පුද්ගලයින් පිළිඳව තොරතුරු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් මන්ත්‍රීවරුන්ට ලබා ගැනිමට අවස්ථා ලබා දෙන ලෙසයි. මෙහිදි අදහස් දක්වමින් ගරු පී. පී. ජී. නදිකා මන්ත්‍රීතුමිය සඳහන් කලේ අප නියෝජනය කරන වසම්වල සියලු දෙනා සාකච්ඡා කර විරෝධතා ඉදිරිපත් කිරිමක් සිදු නොකිරිමට කටයුතු කර ඇති බවත් සුදුසු අයටම පමණක් මෙම ප්‍රතිලාභ ලබා දිමට මුල සිටම පියවර ගැනිමට දැනුවත් කර ඇති බවයි. එලෙසම ගරු සභාපතිතුමා මෙහිදි අදහස් දක්වමින් පවසා සිටියේ යම් යම් වසම් වල තවදුරටත් මෙම ප්‍රතිලාභයන් ලැබිමට වඩාත් සුදුසු පුද්ගලයින් සිටි නම් ඒ පිළිබඳ යෝජනා ලිඛිතව තමා වෙත ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි.

**<u>ගරු ආර්.එම් අබේපාල මැතිතුමා.</u>**

අද දවස යම් යම් පිරිස්වලට හිත් රිදවීම් ඇති වුවත් අප මහජන නියෝජිතයින් ලෙස අවබෝධයෙන් කතා කර සභාවේ හැසිරිමට වගබලා ගතයුතු බවයි. අප මීට පෙර බලය හිමිව සිටි අය බවත් අප අතර ද සංවාද තියෙන්නට පුළුවන්. නිරාකරණය කර ගැනීම සඳහා පොත්පත්, අණපනත්, රිති හා ආදර්ශ ඉතා හොඳින් පරිශිලනය කරමින් අවබෝධයක් ලබා ගැනිමට කටයුතු කළ යුතුය. කාලය නිකරුණේ අපතේ යවන්න එපා. තවද ඇතිමලේ නගරය ආසන්නයේ ප්‍රධාන මාර්ගය කපා දැමීමට පියවර ගන්නා ලෙස මා

ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවන්න. ගරු සභාපතිතුමා හා මහා සභාවට පවතින නිශේද බලය යහපත් කරුණු වෙනුවෙන් පාවිච්චි කරමු. එලෙසම සියලුම දෙනා සාධනිය තීරණ ගැනිමට මැදිහත් වියයුතුය. ප්‍රධාන ගැටළුවන්ට පවතින අලි වැට ඉදි කිරිමේ කටයුතු සඳහා මැදිහත්ව පියවර ගන්න ලෙස මා ඉල්ලා සිටිනවා. එලෙසම දැනට අවධානම් තත්වය යම් තරමකින් හෝ සමනය කර ගැනිම සඳහා අවශ්‍ය ස්ථානවල විථි පහන් සවි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා.</u>

අද සභාවේ කටයුතු කර ගෙන යාමේදි ඇතිවූ තත්වයන් සම්න්ධයෙන් කනගාටුවන බවත් , පසු ගිය සභා දෙකම අප සියලු දෙනා පොදු සම්මුතියකට පැමිණ එක කණ්ඩායමක් ලෙස කටයුතු කිරිමට පියවර ගත්තා. ඉදිරියටත් ඒ අයුරින් කටයුතු කිරිමට අප පියවර ගනිමු. සමන් මන්ත්‍රීතුමා හිටපු ගරු සභාපතිවරයෙක් හැටියට කටයුතු කර තිබිම තුල ලබා ඇති අත්දැකිම් අපිට ඉතා වටිනවා. එහෙත් රැස්වීමක් හෝ සභාවක් පාලනය කිරිමට නිති රිති ලබා දී තිබේ නම් ඒවා පදනම් කර ගෙන අප කටයුතු කළයුතුය. ප්‍රාදේශිය සභාවේ කාලය වසර 34 වුනාට අප බහුතරයක් ආධුනිකයි. අපි කවුරුත් මේ සම්බන්ධව ඇති මාර්ගෝපදේශ පරිශිලනය කළයුතුයි. අධි තක්සේරුවක් මත කටයුතු කරන ඕනෑම කෙනෙක් කඩා වැටිය හැකිය. ඒ නිසා අප කවුරුත් උපරිම ආදර්ශයෙන් කටයුතු කරමු. මේ සඳහා විනය අත්‍යාවශයයි. සභාවේ විනය යනු සභාවේ රීතියි. පනත පාලන අධිකාරිය විසින් මෙහෙය වීම සඳහා පදනම් කර ගන්නා ලේඛනයයි. ඒ තුළින් සභාවේ කාලය ඉතිරි කර ගැනිමට හැකිවේ. ඒ අනුව ඉදිරියට වඩාත් හොඳින් කටයුතු කර ප්‍රදේශයේ ජනතාවට මැදිහත්ව කටයුතු කරමු.

<u>ගරු සභාපතිතුමා</u>

අද දින වර්තමාන ප්‍රාදේශිය සභා ධුර කාලය වෙනුවෙන් අලුතින් පැමිණි පොදුජන එක්සත් පෙරමුණේ සියලුම මන්ත්‍රීවරුන්ට ජනතා අදහස් ප්‍රකාශයට මෙන්ම ඔවුන්ට සුභාශිංශන පිරිනැමිම සඳහා අවස්ථාව ලබාදෙන ලදි.

<u>ගරු ඩබ්.පී සමන් වර්ණකුලසුරිය මැතිතුමා</u>

තමා මෙවර සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවට පත් කර එවිමට ජන්දය දී සහය දැක්වූ සියලු දෙනාටත් ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාටත් ගරු ශෂින්ද්‍ර රාජපක්ෂ හිටපු ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිය පුද කරන ලදි. මෙම සභාව සාර්ථකව කරගෙන යාමට වත්මන් ගරු සභාපතිතුමා ඇතුළු නවක මන්ත්‍රීවරුන්ට සුභාශිංශන පිරිනමන ලදි. අපි අපේ කාලයේ විශාල වැඩ කොටසක් ඉටු කළා. මා පැමිණෙන විට ආයතනයේ වාහන දෙකක් පමණක් තිබුණා. මා සභාපතිධුරය අවසන් වී යන විට වාහන 22ක් බවට පත් කිරිමට හැකිවුනා. අපි තීන්දු තිරණ ගැනිමේදි යම් යම් අඩුපාඩු තියෙන්න ඇති. එහෙත් පොදු යහපත වෙනුවෙන් අපි කටයුතු කලා. මෙම කාර්යාලය ගොඩනැගිල්ල අපි විශාල පරිශ්‍රමයක් දරලා ලබා ගත්තා. අපේ ආයතනයට වත්කම් රාශියක් එකතු කලා. එලෙස අපි කරගෙන ආ කටයුතු ඔබ වඩාත් හොඳින් කරගෙන යන්න උත්සාහ ගන්න. ආයතන වශයෙන් ගත් කළ සමහර නිලධාරින් ඉතා හොඳින් සහයෝගය ලබා දුන්නා. සමහර අය එක් එක් පැති අරගෙන කටයුතු කල අවස්ථාද තිබුණා. ගරු සභාපතිතුමනි, ඔබ මෙම කොට්ඨාශයේ ප්‍රධාන පුරවැසියා ඒ නිසා අන්තර් ආයතන සමඟ හොඳින් සම්බන්ධිකරණය කර ගනිමින් කටයුතු කරන්න උත්සාහ ගන්න. බොහෝ අය පුද්ගලික කාරණා ඉටුකර ගැනිම වෙනුවෙන් මැදිහත් වෙනවා ඒවා අපි හොඳින් අවබෝධ කරගත යුතුයි. අප කුහක අය නොවේ. කිසි විටකත් මම හොරකම් කිරිම්වලට කිසිදු ඉඩක් දුන්නේ නෑ. සමාජයේ සියලුම දෙනා නරක නැහැ. ඒ නිසා සියලු දෙනා සමඟ සාකාච්ජා කර ඉතා හොඳ තිරණ ගන්න. කොට්ඨාශයේ උක් ගොවින්ගේ තිබෙන ප්‍රශ්නය සඳහා මැදිහත් වී ජනතාවට වඩා හොඳ සාධාරණ තීරණ ගැනිමට පියවර ගන්න කියා ඉල්ලා සිටින ලදි.

**ගරු කේ.එම්.ගුණරත්න මැතිතුමා**

නවක මන්ත්‍රීවරයෙකු ලෙස මට මෙතනට එන්න ජන්ද දිපු සියලු දෙනාට ස්තුතිය කරනවා. හිටපු ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු ශෂින්ද්‍ර රාජපක්ෂ මැතිතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තුතිය පුද කරනවා. අද දවස මට සුවිශේෂී දවසක් මම අද ගොඩක් දේවල් ඉගෙන ගත්තා. ඉදිරියට ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කටයුතු කිරිමට මා පියවර ගන්නා බව සඳහන් කරන ලදි.

**ගරු පී.පී.ජී.නදිකා මැතිතුමිය.**

මා නැවතත් මන්ත්‍රීවරියක් ලෙස පත්කර එවූ සියලුම දෙනාටම ස්තුතිය පල කරන බව පවසන ලදි. එලෙසම ගරු සභාපතිතුමාටත්, උපසභාපතිතුමා සහ නවක මන්ත්‍රීවරුන් සියලු දෙනාටම ස්තුතිය හා සුභාශිංශන පුද කරනවා. අපේ පක්ෂයේ මා සමඟ තරඟ කල සහොදර මන්ත්‍රීන් 14 දෙනාටත් ස්තුතිය පුදකරනවා. ප්‍රාදේශිය සභාව විසුරුවාහැර තිබු කාලයේ දී පොදු මහජනතාවගේ අවශ්‍යතා ඉටු කර ගැනිම සඳහා දුරකථනයෙන් පවා දැනුම් දුන් අවස්ථාවලද, සභා ලේකම්තුමා කාර්මික නිලධාරිවරයා හා නිලධාරින් අපට උදව් කළා. ඒ පිළිබඳව ස්තුතිය පළ කරනවා. ඉදිරියේදි සභාව විසින් ගන්නා සියලුම සාධනිය යෝජනාවලට සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු එච්.එම්.මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා**

මෙය අපි සියලු දෙනා මෙම සභාවේ කතා කරන සියලුම දේවල් සහ පවතින අර්බුදකාරි තත්වයන් සභාවෙන් පිටව යනවිට හිතින් අයින් කරගමු. ප්‍රදේශයේ ගොවියන් වෙනුවෙන් පවතින ගැටළු සඳහා ප්‍රාදේශිය සභා කමිටුවේදි කතා කරන්න ඔවුන් වෙනුවෙන් හඬක් නගන්න කියා ඉල්ලා සිටිනවා. අපි කොට්ඨාශයේ පාරවල් භාවිතා කරන ඇතිමලේ වැව්ලි සමාගම හා KST ආයතනය සම්බන්ධ කරගෙන පාරවල් කැපිමට සහයෝගය ලබා ගමු. ප්‍රජා පොලිස් ඒකක හරහා පාරවල්වල පැවැත්වෙන සැණකෙලි හා කානිවල් වීධිමත් කිරිමට හා පාලනය කිරිමට පියවර ගනිමු. අපි ඉදිරිපත් කරපු ගැටළු පිළිබඳවත් අවධානය යොමු කරන්න. පහත ආරාව, වැදි කුඹුර පාර දෙපස වල් වැවි තිබෙනවා. ඒ නිසා අනාරක්ෂිත තත්වයක් ඇතිවෙලා. අත්‍යවශ්‍ය ස්ථානවල විදි පහන් සවි කිරිමට මැදිහත් වෙන්න. එලෙසම අස්වැසුම ගැටළුවටද සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. මා දන්නා හැටියට දැනට නම් ඇතළත් කිරිමට නොහැකි බව පවසනවා. කොට්ඨාශයේ පාරවල් කපන විට මෝටර්ග්‍රේඩර්ය එවන දින අපට දැනුවත් කරන්න. තවද කොට්ඨාශයේ වන අලි ගැටළුවට සාධාරණ විසඳුමක් දෙන්න මැදිහත් වෙන්න. පසුගිය දිනවල සිදු වූ වන අලි ප්‍රහාරයන්ගෙන් ජීවිත හානියට පත් පුද්ගලයින් වෙනුවෙන් මෙම සභාවේ කණගාටුව ප්‍රකාශ කර ගන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා යනුවෙන් පවසන ලදි.

**ගරු උපසභාපතිතුමා පී.කේ.අසංක ඉදුනිල් මැතිතුමා**

ඉදිරිපත් වූ කරුණු සියල්ල අනුව සහ රටතුල පවතින ප්‍රවනතාවය අනුව අප 24 දෙනා පළමුව ආදර්ශමත් වෙමු . කොට්ඨාශය පවතින ඉඩම් ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් සෙවිමට ගරු පරිසර ඇමතිතුමා සමඟ ක්ෂේත්‍රය චාරිකාවන් ගිය බව පවසන ලද අතර එම ගැටළුවෙදි සියලු දෙනා හිර වී සිටින බවත් දැනෙන බව පවසන ලදි. කැලේ කපනවට අපි විරුද්ධයි. එහෙත් ගොවින් සාධාරණයක් විය යුතුයි. කොට්ඨාශයේ විදි පහන් සවි කිරිමට දැනටමත් මිලදී ගැනිම් සඳහා සියලු කටයුතු සිදු කර ඇති බව දැනුම් දෙන ලදි. ප්‍රජා පොලිස් කමිටු පිහිටි විමේදි 2025 පොලිස් චක්‍රලේඛ මගින් ලබාදී තිබු උපදෙස් අනුව කටයුතු කර ඇති බව පවසන ලදි. සමස්ථයක් ලෙස අපි මිනිසුන්ගේ යහපත් මනෝභාවය ඇතිවන අයුරින් කටයුතු කරමු යනුවෙන් පවසන ලදි.

**ගරු සභාපති ඩබ්.වී සුසන්ත ප්‍රදිප් කුමාර මැතිතුමා.**

අද දින උදේ සිදු වු සංවාදය කනගාටුදායක බවත්, නැවත එසේ සිදු නොවිය යුතු බවත්,  මෙය තවත් එක් සිදුවිමක් පමණක් විය යුතුයි. මේ වන විට කොට්ඨාශය තුල විශාල වැඩ කොටසක් සිදු කරමින් පවතිනවා. අපි සැම අංශයෙක් කෙරෙහිම අවධානය යොමු කර තිබෙනවා .පසුගිය දිනක වාරි කාර්මාන්තය නඟා සිටු විමට අවශ්‍ය මුලික පියවර ගැසුවා. කොට්ඨාශයට කෝටි 12ක් පමණ වෙන් කර තිබෙනවා( PSDG) පළත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කර ප්‍රතිපාදන වලින්ද හදුනාගෙන තිබු වැඩ කොටස් රාශියක් ඉටු කරමින් සිටිනවා. අපි උක් ගොවින්ගේ ගැටළුවට මැදිහත්ව කටයුතු කරනවා. රාජය උක් මිළ දි ගන්නේ නැහැ උක් ව්‍යාපාරික ප්‍රජාව හා ආයතන මැදිහත්ව එම ගැටළුකාරි තත්වයන් කළමනාකරණ කිරිමට කටයුතු කල යුතුය. විශේෂයෙන් අපිට උදව් කල අයට අපි විශේෂයෙන් වරප්‍රසාද ලබා දි නැහැ. අප සියලු දෙනා මෙම තත්වයන් විසදිමට මැදිහත් වන කණ්ඩායම විය යුතුයි. වඩාත් හොඳ තැනකට ජනතාව සහ රට ගෙන යාමට එකම කණ්ඩායමක් ලෙසින් සහයෝගයෙන් වැඩ කිරිමට අප සියලු දෙනා පියවර ගනිමු යනුවෙන්  පවසමින් සභාවේ කටයුතු අවසන් කරන ලදි. මිළඟ මහා සභා වාරය 2025.08.29 දින පෙ.ව 9.00ට පැවැත්වෙන බව සභාවට දැනුම් දෙන ලදි.

....................................................

ඩබ්.වී.සුසන්ත ප්‍රදිප් කුමාර,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

# 2025.07.30 දින මාසික මහ සභා රැස්වීම් වාර්තාව

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
මාසික මහ සභා රැස්වීම් වාර්තාව
ස්ථානය :- සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය
දිනය :- 2025. ජුලි මස 30
වේලාව :- පෙ.ව.9.00.

<u>සහභාගීත්වය</u>

01. ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර  මැතිතුමා - ගරු සභාපති
02. පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා - ගරු උප සභාපති
03. ජී.එම්. සුනිල් ප්‍රේමරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. ජී. ශානිකා ප්‍රියදර්ශනි මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
07. කේ.එම්.ධර්මදාස බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.ආර්.එම්. අමරවංශ  මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. එල්.එච්.හර්ෂනි මධුමාලී මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
12. බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. ඩබ්.ජී. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. එම්.ජී. චාන්දන බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. ආර්. එම්. අබේපාල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ඩී.එම්. මධුරාණි දිසානායක මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
19. ආර්.එම්. හේමලතා මැණිකේ මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
20. එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී
21. ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී